රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 3000 ස්ථලය**
**පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්**

**SLS 31513/31613 - සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යය**

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය **03**

---

1. පහත දැක්වෙන ගද්‍ය පාඨවල අර්ථ ලිහිල් බසින් ලියා අංකිත පදවලට විවරණ සපයන්න.

(අ).

එහි දණ්ඩකාරණ්‍ය වල් වූ පරිදි කිසෙ යැ යත්: සරභඞ්ග බොධිසත්ත්වයන් ගෙ තවුස් පිරිස් අතිවිපුල භාවයට ගිය කල්හි බොසතාණන් අතැවැසි, සත් තවිසන් කෙරෙහි කිසවච්ඡ නම් තවුස්පාණ කෙනෙක් විවික්ත වැ වාස[1] කටටි වැ තවුස්ගණ[2] පියා ගොදවරී හො තෙරෙහි ගිවුළු වනයෙන් නික්මැ කලිඟු රට දණ්ඩකී නම් රදු ගෙ[3] කුම්භවතී නම් නුවරක් නිසා උයන්හි වෙසෙති. ඔව්නට සෙනාපති උපස්ථාන කෙරෙ. එ කල්හි එ නුවර ගණිකාවක් රථයට[5] නැඟී පන්සියක්[6] මාගමුන් පිරිවරා නුවර හොබවමින් ඇවිද්දි. මහාජනයො[7] ඇය[8] බල-බලා පිරිවරා-ගෙනැ[9] ඇවිදුති. මිනිසුන් ගෙ ගැළියායෙන් මහවෙ නො පොහොයි. රජ සිහිමැදුරෙහි සිටැ බලනුයෙ, ඇය දැකැ "හො[10] කවර?"[11] යි පිළිවිත. "මහරජ, තොප ගෙ නගරසොභිනී[12] යැ" යි කීහු. හෙ ඊර්ෂ්‍යායෙන් "කිම, නුවර ඇය විසින් හොබී ද! තෙමෙ තමා විසින් මැ හොබී" යි ඇයට උදහස් වැ තනතුරු හරවා ගතැ.[13] හො ඔවුනොවුන් හා සසග[14] කොටැ තම හට වහල් වනුවන් සොයා[15] ඇවිදුනී[16] එක් දවසක් රදු ගෙ[17] උයනට වැද සක්මන් කෙළවර ආලම්බන ඵලකයෙහි වැතිර පහණ සලවටැ හුන් තවුස්පාණන්[18] දැකැ "මෙ තවුස් කිලිටි.[19] පහයින් නොගත්තෙ යැ. උඩුදැළියෙන් මුව[20] වැසුණෙ යැ. යටි දැළියෙන් ළමැඩි[21] වැසුණෙ යැ. දෙකිසිල්ලෙහි කෙහෙ දිගැ. මම එක් දූයක් සඳහා ඇවිදුනෙයිම්.[22] දැන් කාලකණ්ණියක්හු දිටිමි. දිය ගෙනෙව, මා ඇස් දෝනටයැ"යි දිය දැහැටි[23] ගෙන්වා-ගෙනැ දැහැටි[23] කා[24] තවුප්සාණන්[25] වෙර පිඬි[26] කොටැ කෙළ පියා, දැහැටි[23] දළමඬුලුමුදුනෙහි බහා-ලා මුව සලා[27] මුදුනෙහි දිය එවැ[28] "මා විසින් කාලකණ්ණී[29] දුටු ඇස්[30] දෝනා ලද. පව් පුවහන ලදැ"යි කියා[31] ගියා.

(අමාවතුර - (සංස්.) කෝදාගොඩ ඤාණාලෝක හිමි)

(ආ)

එ කෙණෙහි මුහුදු දිය කඳ දවා-ගෙනැ වඩබා මුඛයෙන් පිටත් වැ ගිය අවීචියෙහි ගිනි කඳක් සෙ රළු වූ මතැත් තෙමෙ සොඬ හකුළුවා-ගෙනැ මහ පොළොව යදඬෙන්[1] ගැසූසණ්ටාවක් සෙ අනුරාව[2] දෙවමින්, ගිගිරු හඬින් මුළු[3] නුවර අසනිපාත-යක් සෙ තතනුවමින්, කෝපයෙන් පය ඇඳලූ කෙණෙහි මැ ළිකුළු හුයක් කඩන්නා සෙ බැඳැලූ යදම බිඳැ[4] සුණු විසුණු කෙරෙමින්, නෙළුඹු දලියක් උපුරන්නා සෙ බැඳැලූ කඹය[5] පෙරළී සිටැ ඇනැ තුතු කෙරෙමින් සිටි ඇත් හල පැහැරැ ධූලි කෙරෙමින්, බිඳැපූ කඹය[6] හකුළුවා[7] දළ හස්සෙහි තබාගෙනැ, තමා ගෙ සේයට ඇනැලූ ඇත්මෙන් මහ පොළොව දදුරු කොටැ, දළැ ඇවිළැගත්[8] පසින් භයඞ්කර වැගිය අක් පහරින් මහ පොළොව කැණැ, එ පස් ගෙනැ පිටට ඉස්මින්, දිවැ ලුහුබඳවා අල්ලා පළාපූ මිනී දළගෙහි[6] අවුණාගනිමින්, ලෙහෙයෙන් රැඳී ගිය මුහුණින්, ලෙහෙයෙන් රැඳී ගිය දෙ දළින් ගොන් මිවුන්[10] ලුහුබඳවා ගෙනැ ඇනැ පළමින්, ඔවුන් ගෙ අතුණුබහනින් වෙළීගිය දළින් බැලුබැලුවන් ඇස් පියවමින් කෝපයෙන් සොඬ කටැ ලාගෙනැ හිස සලසලා ගුගුරමින්, දෙරටු අටලු-පවුරු-පදනම් ඇනැ හෙළා සුණුවිසුණු කෙරෙමින් අවුත් වීථියට වැදගියෙ යැ. පෙරළා බැලූ මිනිස්සු ඇතින් එන ඇතු දුටහ. අබෞද්ධයො සතුටු වැ ගියා හ. බෞද්ධයො 'කිමෙකින් කිමෙක් වේ දෝ හො'යි හැකිළෙන්නට වන්හ.

(බුත්සරණ - (සංස්) ලබුගම ලංකානන්ද හිමි.)

(ඇ)

එ කල ස්වාමිදරුවෝ තමන් කෙරෙහි එද ඔහු කළ සන්තොෂ-යෙන් මතු බොහෝ වැඩ වන සේ දැක තමන් වහන්සේ ද මඳ මඳ සිනා පහළකොට ඔහු මුහුණ බලා: ''ආජීවක ය, මම ශක්‍රයාත් නො වෙමි, බ්‍රහ්මයා ත් නො වෙමි, සම්මා සම්බුද්ධයෙමි, සියලු සංස්කාර ධර්මයන් සකසා නිමවා දතිමි, දුරුකළමනා ධර්මයන් යට අජටාකාශයට උඩ අජටාකාශය සේ දුරින් දුරුකෙළෙමි, භාවිත කළමනාධර්මයන් හැම අළලා අමාපිඩක්සේ හැරගතිමි, සදෙවුලෝ වැසියන් මට කුලගැති කෙළෙමි, මා පා පිසපු බිස්ස පවා බ්‍රහ්මයාට මුදුන්මල් කෙළෙමි, දෙවාතිදෙව වීමි, ශක්‍රාතිශක්‍රවීමි, බ්‍රහ්මාතිබ්‍රහ්මවීමි, වන්දනීයයාති වන්දනීයය වීමි, පූජනීයයාති පූජනීයය වීමි, සද්ධර්මවරචක්‍රවර්ති වීමි, දෙව්බඹුන් අතින් මෙහෙ ගෙනපීමි, පස්මරුන් ජයගෙන පීමි, එසේ ජයගෙන සිටි හෙයින්, ආජීවක ය! මට අනන්තජිනයෝ යයි යෙති''යි වදළ සේක.

(පූජාවලිය (සංස්) කිරිඇල්ලේ ඥාණවිමල හිමි)

(ඇ)

මනා ගුණ නිවෙස් වූ බුදුසිරි සතොස් වූ රැස් වූ දෙවි බඹුන් දහම් අමාරසයෙන් පිනවා දෙව්රම වෙහෙර වැඩ ඉක්බිති සනරාමරලොකයෙ හි සැරිසරා වඩිමින් සත්ත්වාභිවෘද්ධය පිණිස සද්ධම්ම දෙශනා කරන කල් හි තමන් වහන්සේ ගේ <u>සුරක්තාධර</u> පල්ලවාන්තර නමැති සඳවලා ගැබින් නිකුත් චන්ද්‍රරේඛාවක් පරිද්දෙන් විරාජමාන වූ සතර දළදා වහන්සේ ගෙන් නිකුත් හිමකර කරසාර වූ රස්පතරින් නේවිනේ කුමුදුවන පුබුදුවමින් සද්ධම්ම භෙරි නාදයෙන් සියලු සත්ත්වයන් සවාසන සකල ක්ලෙශසම්මොහනිද්‍රාමුද්‍රාපිද්‍රාපණය කෙරෙමින් පන්සාළිස් අවුරුද්දක් මුළුල්ලෙ හි පරාත්ථචර්ය්‍යාව කෙරෙමින් සුවිසි අසංඛ්‍යයක් සත්ත්වයන් සංසාර සාගරයෙන් ගොඩලා, කළ මනා බුද්ධ කෘත්‍යය තාක් නිමවා

(දළදා සිරිත (සංස්) වැලිවිටියේ සෝරත හිමි)

2. අමාවතුරේ පරිවර්තන රීතිය පිළිබඳ විමසීමක් කරන්න.

3. "සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයෙහි පැනෙන සුවිශිෂ්ට වර්ණනාත්මක කාව්‍යය බුත්සරණයි." සනිදර්ශනව සාකච්ඡා කරන්න.

4. පූජාවලිය භක්ති කාව්‍යයක් බවට පත්වීම සඳහා එහි රචනා ශෛලිය දක්වන දායකත්වය පිළිබඳ විමසීමක යෙදෙන්න.

5. "ධර්මෝපදේශ හුවා දක්වමින් කථා කීම සද්ධර්මරත්නාවලී කථා කලාවේ සුවිශේෂ ලක්ෂණයකි." නියමිත කථාවස්තු ඇසුරින් සාකච්ඡා කරන්න

6. "ස්ත්‍රිය විෂයයෙහි ජාතක කථාකරුවා දක්වන දෘෂ්ටිය හුදෙක් නිර්දය වූවක් ම නො වේ." මෙයට පක්ෂව හෝ විපක්ෂව නිර්දේශිත ජාතක කථා ඇසුරෙන් විශ්ලේෂණාත්මක විග්‍රහයක යෙදෙන්න.

7. අවස්ථා සහ සිද්ධි වර්ණනයෙහි ලා දළදා සිරිත් කතුවරයා යොදා ගන්නා භාෂා උපක්‍රම කවරේ දැ යි සනිදර්ශනව පහදන්න.

(02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගිනි)

@@@@@@@@@@@@@@@@@@@@@@@@@